**අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම - 2015**
-------------------------------------------------------

## 01. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාචනය

අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස නවයක කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුකොටගෙන, විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව, 2015 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය, මාස නවයක කාලසීමාව සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළිබඳව මම අදහසක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව මාගේ විගණනය සිදු කළෙමි. මගේ වගකීම්, එම ප්‍රමිතීන් යටතේ මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වන විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මතයක් සඳහා පදනමක් සැපයීමට මා ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් නොවන බව මම විශ්වාස කරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අධිකාරිය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ. | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස 9 ක කාලපරිච්ඡේදය සඳහා මුළු ආදායම රු. මිලියන 78.5 ක් වේ. කෙසේ වුවද, එම ප්‍රමාණයෙන් රු. මිලියන 28.8 ක් පමණක් "බස් රථවලට මගීන් භාර දෙන පත්‍රිකා" (ETC පත්‍ර) යන මූලාශ්‍ර ලේඛනය මගින් තහවුරු කර තිබුණි. එම ආදායම්වල නිරවද්‍යතාව සත්‍යායනය කිරීම සඳහා මෙම ටිකට්පත්වල දෙවන පිටපත් විගණනය වෙත ලබා දී නොතිබුණි. ආදායමේ ඉතිරි කොටස බැංකු තැන්පතු මගින් ගිණුම්ගත කර තිබුණි. එමනිසා, ආදායමේ නිරවද්‍යතාව සහ පරිපූර්ණත්වය විගණනයේ දි තහවුරු කිරීමට නොහැකි විය.<br><br>තවද, බැංකු තැන්පතු මගින් ගිණුම්ගත කර තිබුණු ආදායම ඉන්ධන සඳහා වියදම, කොමිස්, අධිවේගී මාර්ග භාවිත කිරීමේ ගාස්තු සහ වාහන නැවැත්වීමේ ගාස්තු අඩු කිරීමෙන් පසු ශුද්ධ පදනම මත ගිණුම්ගත කර තිබූ අතර එම වියදම් සඳහා සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එමනිසා, විකුණුම් පිරිවැයේ නිරවද්‍යතාව සහ පරිපූර්ණත්වය පිළිබඳව විගණනයේදී තහවුරු කිරීමට නොහැකි විය. | විගණකවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟ වෙමි. | ආදායම දළ පදනම මත හඳුනාගෙන එහි අදාළ මූලාශ්‍ර ලේඛන භාවිතයෙන් තහවුරු කළ යුතුය. |
| ආ. | බස් රථ සඳහා ඉන්ධන ගාස්තුව එම බස් රථ සඳහා අධිවේගී මාර්ග භාවිත කිරීමේ ගේට්ටු ගාස්තු (tall charges) ඉක්මවිය යුතු වුවද, සමාලෝචිත කාල සීමාව සඳහා මුළු ගේට්ටු ගාස්තුව රු. මිලියන 7.92 ක් වූ අතර ඉන්ධන ගාස්තු රු.මිලියන 4.84 ක් විය. එමනිසා, වියදම පිළිබඳ ගනුදෙනු, වාර්තා කිරීමේ නිරවද්‍යතාව පිළිගත නොහැකි විය. | විගණකවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟ වෙමි. | ගනුදෙනුව වාර්තා කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |

මේ අතර, සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා ආදායම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 පටහැනි වන පරිදි පදනම් දෙකකින් හඳුනාගෙන තිබුණි.

| | | | |
|---|---|---|---|
| ඈ. | 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස 9 ක කාලපරිච්ඡේදය සඳහා සිදු වී ඇති ගනුදෙනු ප්‍රවාහය දැක්වීමට හැකි වන පරිදි යථාකාලීන ලෙජරයක් සමාගම විසින් පවත්වාගෙන ගොස් නොමැති බව නිරීක්ෂණය විය. | විගණකවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟ වෙමි. | දෛනික පදනමින් ගනුදෙනු වාර්තා කිරීම සඳහා ලෙජරය පවත්වාගෙන යා යුතුය. |

## 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 36 වන ඡේදයට අනුව, යම් ආයතනයක් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී තම වාර්තාකරණ දිනය වෙනස් කරන විට, එම ආයතනය වසරක කාල සීමාවකට වඩා අඩු හෝ වැඩි කාලයක් භාවිත කිරීමට හේතුව හෙළි කළ යුතු අතර, සංසන්දනාත්මක සංඛ්‍යා සම්පූර්ණයෙන්ම සංසන්දනාත්මක නොවන බව ද හෙළි කළ යුතුය. සමාගම වාර්තා කිරීමේ කාලපරිච්ඡේද වෙනස් කර තිබුණද, එම කරුණු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | විගණකවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟ වෙමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල විය යුතුය. |
| ආ. | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 16 හි 26 වැනි ඡේදයට අනුව - කල්බදු හේතුවෙන් ඇති වූ මූල්‍ය කල්බදු වගකීම් සහ වත්කම් කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව හඳුනාගත යුතුය. කෙසේ වුවද, සමාගම විසින් ප්‍රමිතියේ දැක්වෙන අවශ්‍යතාවයට අනුව එහි අවම කල්බදු වගකීම් සහ වත්කම් හඳුනාගෙන නොතිබුණි. | විගණකවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟ වෙමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල විය යුතුය. |
| ඇ. | මූල්‍ය ප්‍රකාශනවල අංක 3.12 (12) සටහනේ, වාර්තා කරන දිනයේ වර්තමාන වටිනාකම අනුව නිශ්චිත ප්‍රතිලාභ වගකීම හඳුනාගත හැකි බව දක්වා ඇති නමුත්, සමාගම ප්‍රමිතියට අනුකූලව කටයුතු කර නොතිබුණි. | විගණකවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟ වෙමි. | සමාගම විසින් නියම කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වියදම කාලපරිච්ඡේදයට අදාළ නොවන අතර වැරදි ලෙස වර්ගීකරණය කර ඇති බැවින්, සමාලෝචිත කාලසීමාව සඳහා මූල්‍ය ප්‍රකාශනයේ වැටුප් සඳහා වූ වියදම් රු. මිලියන 2.29 කින් වැඩියෙන් දක්වා තිබුණි. | විගණකවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟ වෙමි. | ගනුදෙනු හා ශේෂ අදාළ කාලපරිච්ඡේදය සමඟ ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලේඛනගත සාක්ෂි නොමැතිවීම

| | අයිතමය | මුදල (මිලියන ) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | වියදම් | 19.89 | ගෙවීම් වවුචර | විගණකවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟ වෙමි. | ගනුදෙනු හා ශේෂ තහවුරු කිරීම සඳහා විගණකවරුන් වෙත සාක්ෂි සැපයිය යුතුය. |
| (ii) | වැටුප් සඳහා දරන ලද වියදම්, අත්තිකාරම් ගෙවීම, ලබා දුන් ණය. | 1.99 | සේවක පඩි ලැයිස්තුව සහ ලේඛන | එම | එම |
| (iii) | ටයර් හා ටියුබ් මිලදී ගැනීම, අළුත්වැඩියා ගාස්තු සහ වාහන කුලිය සහ ඉන්ධන වියදම් සහ රක්ෂණ පිරිවැය | 11.05 | සැපයුම්කරුගේ ඉන්වොයිසි සහ රක්ෂණ සහතිකය | එම | එම |
| (iv) | මහ බැංකුව - භාණ්ඩාගාර ජංගම ගිණුම | 10.86 | ගිවිසුම, මණ්ඩල තීරණය හෝ ශේෂයට අදාළ වෙනත් ඕනෑම ලේඛනයක් | එම | එම |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත කාලපරිච්ඡේදයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 15.13 ක අලාභයක් වූ අතර එයට සමාන ඉකුත් කාලපරිච්ඡේදයේ ලාභය රු. මිලියන 21.64 (රු.28.85*3/4) ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 36.77 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙහෙයුම් ප්‍රතිඵලයේ පිරිහීමක් ඇති වීමට ප්‍රධාන හේතු වූයේ ආනුපාතික පදනමින් ගැළපුම් කිරීමෙන් පසුව, ඉකුත් කාලපරිච්ඡේදයට සාපේක්ෂව, ආදායම රු. මිලියන 3.70 කින් අඩුවීම සහ විකුණුම් පිරිවැය රු. මිලියන 26.37 කින් ඉහළ යාම විය.

## 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

| අයිතමය | 2015 වර්ෂයේ මාස නවයක කාලපරිච්ඡේදය සඳහා | 2014/15 මාස නවයකට ගැළපුම් කරන ලද | ප්‍රතිශතයේ වෙනස්වීම | පූර්ව වර්ෂයේ ප්‍රවණතාව |
|---|---|---|---|---|
| ආදායම | 78,760,637 | 82,459,704 | (4) | අඩු වීමකි |
| විකුණුම් පිරිවැය | 70,455,661 | 44,082,356 | 60 | වැඩි වීමකි |
| පරිපාලන වියදම් | 6,454,940 | 942,423 | 585 | වැඩි වීමකි |
| බස් රථ සඳහා ඉන්ධන | 4,843,111 | 36,656 | 13,112 | වැඩි වීමකි |
| බස් රථ අලුත්වැඩියා ගාස්තු | 8,108,982 | 4,809,891 | 69 | වැඩි වීමකි |
| මෙහෙයුම් වැටුප් | 9,115,029 | 4,806,158 | 90 | වැඩි වීමකි |
| අධිවේගී මාර්ග ගාස්තු | 7,916,200 | 4,450 | 237,090 | වැඩි වීමකි |

එක් එක් කාලපරිච්ඡේදයට අයත් සියලුම ගනුදෙනු අඛණ්ඩව සහ පරිපූර්ණ ලෙස සටහන් නොකිරීමේ තත්වයක් තුළ, ඉහත අයිතම සම්බන්ධයෙන් ප්‍රවණතා විශ්ලේෂණය කිරීම අර්ථ විරහිත වන බව නිරීක්ෂණය විය.

## 2.3 අනුපාත විශ්ලේෂණය

| | 2015 | 2014/15 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 0.36 | 0.70 |
| දළ ලාභ අනුපාතය - ප්‍රතිශතය | 10.54 | 46.54 |
| ශුද්ධ ලාභ අනුපාතය - ප්‍රතිශතය | (19.2) | 21.9 |

පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

I. ජංගම වත්කම් අනුපාතයට අනුව, සමාගමට එහි ජංගම වත්කම්වල වටිනාකමට සාපේක්ෂව වගකීම් විශාල ප්‍රමාණයක් පැවති බැවින්, එහි කෙටි කාලීන ණය ගෙවීමට ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් නොතිබූ බව නිරීක්ෂණය විය.

II. දළ ලාභ අනුපාතය සියයට 36 කින් ද, ශුද්ධ ලාභ අනුපාතය සියයට 41 කින් ද අඩු වී ඇත. ආදායම අඩුවීම සහ විකුණුම් පිරිවැය ඉහළ යාම දළ ලාභය මෙලෙස පහත වැටීමට ප්‍රධානම හේතූන් වූ බව නිරීක්ෂණය වේ.

කෙසේ වුවද, සියලුම ගනුදෙනු නිවැරදිව වාර්තා නොකිරීම හේතුවෙන් නිරවද්‍ය ගණනය කිරීමක් සිදු කළ නොහැකි විය. එම නිසා, ඉහත ඇඟවීම්වල නිරවද්‍යතාව තහවුරු කිරීමට නොහැකි විය.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම වසර පහකට වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි. | අදහස් දැක්වීම ලැබී නොමැත. | නියමිත කාල සීමාව තුළ මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් සමාලෝචිත කාලසීමාව ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්ම පිළියෙළ කර නොතිබුණි. | ඉදිරියේ දී මෙම ප්‍රකාශන පිළියෙළ කිරීමට කටයුතු කරනු ලැබේ. | සංයුක්ත සැලැස්මක් පිළියෙළ කළ යුතුය. |

### 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට සහ ක්‍රියා පටිපාටි අධීක්ෂණය කිරීමට අභ්‍යන්තර විගණන ඒකකයක් සමාගම තුළ ස්ථාපිත කර නොතිබුණි. | අදහස් දැක්වීම ලැබී නොමැත. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කළ යුතුය. |

### 4.4 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් විගණන කමිටුවක් ස්ථාපනය කර නොතිබුණි. | අදහස් දැක්වීම ලැබී නොමැත. | විගණන කමිටුවක් ස්ථාපනය කළ යුතුය. |

### 4.5 අයවැයමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත කාලසීමාව ආවරණය කිරීම සඳහා සමාගම විසින් වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙළ කර නොතිබුණි. | අදහස් දැක්වීම ලැබී නොමැත. | වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙළ කළ යුතුය. |